සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

13 ශ්‍රේණිය

## දේශපාලන විද්‍යාවේ මූලිකාංග

පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(5) | 2 -(1) | 3 -(1) | 4 -(3) | 5 -(1) | 6 -(3) | 7 -(4) | 8 -(3) | 9 -(1) | 10-(4) |
| 11-(5) | 12-(3) | 13-(1) | 14-(3) | 15-(4) | 16-(1) | 17-(3) | 18-(1) | 19-(1) | 20-(3) |
| 21-(5) | 22-(1) | 23-(3) | 24-(1) | 25-(2) | 26-(1) | 27-(1) | 28-(3) | 29-(3) | 30-(1) |
| 31-(3) | 32-(4) | 33-(1) | 34-(1) | 35-(4) | 36-(3) | 37-(3) | 38-(4) | 39-(3) | 40-(2) |
| 41-(5) | 42-(4) | 43-(1) | 44-(5) | 45-(1) | 46-(2) | 47-(5) | 48-(5) | 49-(4) | 50-(2) |

### II කොටස

#### A කොටස

(01) (1) විෂය කරුණු සෙසු සමාජ විද්‍යාවන්ගෙන් පෝෂණය වීම.
දේශපාලන සමාජය පසුබිම්කොටගෙන අධ්‍යයනය කිරීම.

(02) (1) ජනමාධ්‍ය / පවුල් පසුබිම හා සමවයස් කණ්ඩායම්

(03) (1) චර්යාවාදී අධ්‍යයන මාර්ග.
(2) සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම. පද්ධති විශ්ලේෂණ අධ්‍යාපන ක්‍රම.

(04) (1) විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතා කළ නොහැකි වීම.
සමාජ විද්‍යාත්මක චර්යා ගති වෙනස් විය හැකි වීම.

(05) (1) දේශපාලන ජීවිතය මෙන්ම ආගමික ජීවිතයද රාජ්‍ය මගින් හැසිරවීම.
(2) ආර්ථික මිනිසෙකුට වඩා දේශපාලන මිනිසකු වීම.

(06) (1) ක්‍රිස්තියානි පල්ලියේ වර්ධනය දේශපාලන චින්තනය කෙරෙහි බලපෑම් කිරීම.
(2) දාර්ශනික මත හා දේව ධර්මය අතර පැහැදිළි සම්බන්ධතාවයක් පැවතීම.

(07) (1) වැඩවසම් ප්‍රවේනි ක්‍රමය වෙනුවට වෙළඳාමේ දියුණුව සමග ධනවාදී ආර්ථිකයක් ඇති වීම.
(2) විකේන්ද්‍රගත වූ පාලන බලතල වෙනුවට සංකේන්ද්‍රගත මධ්‍යම ආණ්ඩුව ක්‍රිස්තියානු ලෝකයේ එක්සත් කම බිඳී යාම සමග පෙරමුණ ගත් පන්තියක් බිහි වීම.

(08) (1) රාජ්‍යය ආණ්ඩුවේ කටයුතුවලට මැදි නොවීම.
(2) රාජ්‍යය අත්තනෝමතික වේ.

(09) (1) කාර්මික විප්ලවය. (2) ධනවාදය මෝරා යාම.

(10) (1) ඥාතී සබඳතා / ආගම / ආරක්ෂාව

(11) (1) ආණ්ඩුකාරවරයාගේ බලය කප්පාදු කිරීම.
(2) රාජකාරී ක්‍රමය අහෝසි කිරීම.

(12) (1) (2)

(13) (1) මහජන මන්ත්‍රී මණ්ඩලය / සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය.

(14) (1) 29 (1) වගන්තිය / බහු ජන ඡන්ද කොට්ඨාශය.

(15) (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය / ජාතික රාජ්‍ය සභාව.

(16) (1) ඔම්බුඩ්ස්මන් ධූරය.

(17) (1) ශ්‍රේෂ්ඨාධිකරණය / මානව අයිතිවාසිකම් නඩු.

(18) (1) විසිරී ඇති මහජන මතය ඒකරාශී කර තිබේ. සමාජ බලය අධිකාරී බලය බවට පරිවර්ථනය වේ.

(19) (1) ලේකම් කාර්යාලය / ආරක්ෂක මණ්ඩලය.
(20) මහ ලේකම් කාර්යාලය

## B කොටස

(01) (1)
- නවතම විෂය කරුණු දේශපාලන සමාජය පසුබිම් කොටගෙන ප්‍රභවය ලැබීම.
- අධ්‍යයන තේමාව වන්නේ මානවයාගේ සමාජ හැසිරීමේ දේශපාලන පැතිකඩය.
- මෙම විෂය සෙසු සමාජ විද්‍යාවන්ගෙන් පෝෂණය වී තිබීම.

(2)
- දේශපාලන න්‍යායන් හා දර්ශනයන් පිළිබඳ පර්යේෂණාත්මක අවබෝධයක් පුරවැසියාට ලබාදීම.
- ජාතික දේශපාලනය පිළිබඳ දැනුවත් වීම.
- ප්‍රජාතාන්ත්‍රික ජීවන ක්‍රමයක් පිළිගන්නා සමාජයක් ගොඩනැගීම.
- ඉහළ දේශපාලන සමාජානුයෝජනයක් ලබාගැනීම.

(3) දාර්ශනික අධ්‍යාපන ක්‍රමය.

වාසි
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හොඳ නරක ඉතා පැහැදිලිව දැකිය හැකි වීම.
- වඩාත් පරමාදර්ශී තොරතුරු අධ්‍යයනයට ප්‍රවේශයක් ලැබීම.

**අවාසි**
- සැබෑ වශයෙන් පවතින තත්වය නොව පැවතිය යුතුයයි සිතින් මවාගත් තත්වය අධ්‍යයනය.
- රාජ්‍ය හා පුරවැසි අතර සබඳතාවය ප්‍රායෝගික නොවීම.

**තුලනාත්මක**

**වාසි -**
- එකිනෙකාට වෙනස් ආණ්ඩුක්‍රම සැසැඳිය හැකි වීම.
- විශේෂිත අරමුණක් මුල්කරගෙන දේශපාලන ආයතන සැසැඳීම.
- සමාන දේශපාලන පරිසරයන්හි සමාන තත්වයක් හඳුනා ගැනීම.
- සමාන ප්‍රතිඵල ලැබී තිබෙනවාද යන්න සොයා බැලීම.
- ගැටළු සොයා බැලීම.

**අවාසි -**
- එක් රටකට ගැලපෙන දේශපාලන ආදර්ශයක් තවත් රටකට ගැලපිය නොහැකි වීම.
- දේශපාලන ආයතන වල නීතිමය ව්‍යුහය පමණක් සසඳන මෙම ක්‍රමයෙන් ඊට බලපාන මිනිස් හැසිරීම් ආර්ථික සමාජ තත්වයන්, සදාචාරාත්මක අගය කිරීම්, මෙන්ම දේශපාලන සංස්කෘතියේ ස්වභාවය අධ්‍යයනය කිරීමට අවස්ථාව නොදීමයි.

(02) (1) රාජ්‍යයේ ප්‍රභවය සම්බන්ධයෙන් ලිබරල් දේශපාලන මතවාදය පැහැදිළි කරන්නේ සමාජය ක්‍රමික විකාශණයට භාජනය වීමෙන් රාජ්‍යය බිහි වූ බවයි. සමාජයේ පොදු අරමුණු ඉටු කිරීම සඳහා මිනිසුන් එක්ව පිහිටුවා ගත් සංවිධානයක් හැටියට රාජ්‍ය හුවාදක්වන ලිබරල්වාදීන් මෙම උත්තරීතර සමාජ සංවිධානය මිනිසුන්ගේ සමාජ පැවැත්මේ අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙසද දක්වයි. සමාජවාදයට අනුව පන්ති සමාජය බිහිවීමට පෙර රාජ්‍ය නොතිබුණි. රාජ්‍ය බලය එකිනෙකට වෙනස් වූ පන්ති දෙකක් විසින් පාලනය කරන අතර ධනපති පන්තිය රාජ්‍ය පාලනය කරයි.

(2) සම්භාව්‍ය ලිබරල්වාදය තුළ රාජ්‍ය නිර්බාධවාදය දක්නට ලැබුනු අතර රාජ්‍ය නීතිය හා සාමය පමණක් ඉටුකරන සංස්ථාවක් විය. නූතන ලිබරල්වාදයට අනුව එය පොදු ජනතාවගේ උපයෝජනය සඳහා සුභසාධක කටයුතු ඉටුකරන සංවිධානයකි.

(3) ලිබරල්වාදයට අනුව රාජ්‍යය නම් වූ සංස්ථාව යම් යම් වෙනස්කම් වලට භාජනය වෙමින් සදහට පවතින්නකි. සමාජ අභිවෘද්ධිය රාජ්‍යයේ කාර්යය බැවින් සමාජය පවතින තුරු අදාළ කාර්යන් ඉටුකිරීමට රජයද පැවතිය යුතුයි.

(03) **ඉන්දීය සන්ධීය ක්‍රමයේ මූලික ලක්ෂණ.**

සන්ධීය ක්‍රමයක අත්‍යාවශ්‍ය කොන්දේසියක් වන්නේ ස්වාධීන හා අපක්ෂපාතී පෙඩරල් අධිකරණයක පැවැත්මයි. මේ සඳහා ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය එරට ඇති විය හැකි ව්‍යවස්ථානුකූල අර්බුද නිරාකරණය කෙරෙමින් ක්‍රියාත්මක වන පරිදි ගොඩනංවා තිබේ.

මධ්‍යම ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික ක්‍රමයක ගුණාංගයකි. ඉන්දියාවේද ලොක් සභාව හා රාජ්‍ය සභාව ලෙස ද්විමාණ්ඩලිකවාදය මත නිර්මාණය කළ ව්‍යවස්ථාදායකයක් හඳුනාගත හැක.

සන්ධීය ආණ්ඩු ක්‍රමයක් අනම්‍ය විය යුතුය. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ක්‍රම 3 ක් ව්‍යවස්ථාවේ සඳහන් වේ. පළමු ක්‍රමය වන්නේ පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකෙහි සරල බහුතරයකින් සංශෝධනය කිරීමයි. දෙවන ක්‍රමය වන්නේ පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකෙහි විශේෂ බහුතරයකින් 2/3 සහිතව සංශෝධනය කිරීමයි. තෙවන ක්‍රමය වන්නේ පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙකෙහි විශේෂ බහුතරයකින් හා ප්‍රාන්ත රාජ්‍යවල 1/2 බහුතරයකින් සංශෝධනය කිරීමයි. මේ අනුව ව්‍යවස්ථාවේ සඳහන් වැදගත් විධිවිධාන සංශෝධනය කළ හැක්කේ ඉහත තෙවනි ක්‍රමය අනුව පමණි.

ව්‍යවස්ථාවේ 1 වන වගන්තිය මගින් ඉන්දියාව සන්ධීය රාජ්‍ය සංගමයක් (A UNION OF STATES) ලෙස දක්වයි.

- <u>**සන්ධීය ක්‍රමයේ වාසි අවාසි**</u>

<u>**වාසි**</u>

සංධීය ක්‍රමයේ මූලික වශයෙන් ඒකීයත්වය හා විවිධත්වය යන අන්ත දෙක අතර සමතුලිත තාවයක් ඇතිකර ගැනීමට ඉඩ සලසන අපූරු නිර්මාණයක් වීම නිසා විශේෂයෙන්ම සජාතීය නොවන බහුවිධ සමාජයන්ට මෙම ආණ්ඩුක්‍රමය ආදේශකර ගැනීමේ හැකියාවක් පවතී.

වෙන් වූ ජන කණ්ඩායම් හා විෂමතාවන් සහිත ප්‍රදේශවලින් යුක්ත රාජ්‍යයන්හි කිසියම් සමගියක් හා ඒකීයභාවයක් පවත්වා ගැනීමට සන්ධීය ක්‍රමය උපකාරී වේ.

යම් රාජ්‍යයක පොදු කරුණු පිළිබඳව එක්සේසත්ව කටයුතු කෙරෙන අතරම විවිධ ජන කොටස් හෝ ප්‍රදේශවලට කිසියම් ස්වාධීන ආකාරයකින් කටයුතු කිරීමට ඉඩකඩ ලැබීමද වාසියකි.

<u>අවාසි</u>

පරිපාලනයේ අකර්යක්ෂමතාවය හා සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රමාදවීම් වලටද එය හේතු වේ.

රට තුළ ජාතික අනුකරණයක් ගොඩ නැගීමේදී බාධා ඇතිවිය හැකි වීම.

වෙන්ව යාමේ තර්ජනය නිරතුරුව තිබිය හැකි වීම.

සමාජ ආර්ථික වර්ධනය අඩාල වීම.

(04) (1) මානවයකු වීමේ හේතුවෙන් ඔහුගේ පැවැත්ම සහ ගෞරවය උදෙසා භාවිතයට ගැනෙන සියලුම අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් වේ. සදාචාරය සමග බෙහෙවින් සම්බන්ධ වී ඇති මෙම අයිතිවාසිකම් සෑම මනුෂ්‍යයෙකුටම ලැබිය යුතු බව නීතිය පිළිගනී.

(2) ජනතාවගේ අදහස් විමසීම සඳහා කරනු ලබන විචාරණ ක්‍රමය ජනමත විචාරණය වේ.

(3) නීතියේ ආධිපත්‍ය නීතිය උත්තරීතර බව නීතියේ ආධිපත්‍ය පිළිබඳ සංකල්පය පැහැදිලි කරයි. ඒ. වී. ඩයිසි විසින් රචනා කරන ලද LOW ON THE CNSTITUTION කෘතිය මගින් නීතියේ ආධිපත්‍ය තහවුරු කරන ප්‍රධාන ලක්ෂණ 3 ක් පැහැදිලි කරයි.

1. පොදු නීතිය උත්තරීතර වේ.
2. නීතිය ඉදිරියේ සියලු දෙනාම සමාන වේ.
3. නීති මගින් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(4) බලතල බෙදීම ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ වශයෙන් ආයතන ගතව ආණ්ඩුවේ බලතල බෙදා දැක්වීම මිනිසු නිදහස සුරක්ෂිත කිරීමට අත්‍යවශ්‍ය යන්න බලතල බෙදීමේ හරය වේ.

(05) <u>නිදහසට පෙර යුගයේ පහත මාතෘකා විමසන්න.</u>

**වාමාංශික ව්‍යාපාරයේ ලක්ෂණ.**

සම සමාජ පක්ෂ ආරම්භක අවස්ථාවේදී ඔවුන් ප්‍රකාශයට පත්කළ අරමුණු 3 කි. (මෙම පක්ෂය වාමාංශික ව්‍යාපාරය සංවිධානාත්මක වීමට හේතු විය.)

1. පූර්ණ ජාතික නිදහස.
2. නිෂ්පාදනය, බෙදා හැරීම හා හුවමාරු මාධ්‍යයන් සමාජ සංකේත කිරීම.
3. පන්ති, කුල, වර්ග, ආගම් හා ස්ත්‍රී පුරුෂ භේදයෙන් පැන නගින සියළු සමාජ, ආර්ථික භේදයන් නැති කිරීම.

- ජාතික ව්‍යාපාරය තුල වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික දුර්වලතා වැළැක්වීමට ක්‍රියා කිරීම.

- ඒ. ඊ. ගුණසිංහ මහතා විසින් කම්කරු ව්‍යාපාරයට නායකත්වය සැපයීමට ක්‍රියා කිරීම.

**දේශපාලනයට උගත් මධ්‍යම පංතියේ බලපෑම.**

1908 වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඇරඹෙන අතර මෙහි මූලික අරමුණ වූයේ දේශීය මධ්‍යම පංතියට ව්‍යවස්ථාදායකය තුළ සහභාගීත්වයක් නැතහොත් නියෝජනයක් ලබාගැනීමයි. ඒ අනුව 1911 කෘව්මැකලම් ප්‍රතිසංස්කරණයෙන් පළමු වරට ව්‍යවස්ථාදායක සභාවට උගත් ලාංකිකයන් වෙනුවෙන් ආසනයක් වෙන් වූ අතර 1912 දී ඇරඹෙන අමද්‍යප ව්‍යාපාරය සංවිධානය කිරීම සඳහාද මධ්‍යම පංතික නායකයන් ක්‍රියා කිරීම.

ජාතික ව්‍යාපාරයේ නායකත්වයේ සමාජ පසුබිම ලාංකික අනන්‍යතාවය පෙරටුකොට නොගත් බටහිරකරණය වූ ජන්මයෙන් පමණක් ලාංකික වූ කලු සුද්දන් පිරිසක් විසින් මෙහෙය වීම තුළ ජාතික ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ මෙන්ම ක්‍රියාමාර්ගද එම සමාජ කණ්ඩායම පිළිගත් හා විශ්වාස කළ අදහස්වලට සමපාත විය. ජතික ව්‍යාපාරයේ මෙම පටු පදනම නිසා ඔවුන් කණ්ඩායම් වාදීන් ලෙස හැසිරෙනු දැකිය හැක.

* ගතානුගතිකවාදීන් * මධ්‍යස්ථමතධාරීන්. * රැඩිකල්වාදීන්.

- මධ්‍යම පංතික රැඩිකල් බුද්ධිමතුන් මෙරට අරඹන වාමාංශික ව්‍යාපාරය වඩාත් සංවිධානාත්මක වන්නේ 1935 දෙසැම්බර් මස දී ලංකා සම සමාජ පක්ෂ පිහිටුවීමත් සමගය.

(06) 1948 හා 1972 නාමික විධායකය සත්‍ය විධායකය හා ස්ථිර විධායකය

- සොල්බරි ආණ්ඩුක්‍රමය වූ කලී කැබිනට් විධායක ආණ්ඩුක්‍රම ආකෘතියකි. කැබිනට් විධායකය තුළ නාමික

විධායකය වූයේ අග්‍රාණ්ඩුකරුය. ඔහු තේරීම හා ඉවත් කිරීමේ බලය රජිණ සතු විය. මොහුගේ සාමාන්‍ය නිල කාලය වසර 5 කි. මොහු රාජ්‍ය නායකයා ලෙස යම් බලතල ප්‍රමාණයක්ද ව්‍යවස්ථාදායක බලතල මෙන්ම විධායක බලතල ද හිමිකරගෙන සිටියේය. විධායක බලතල ලෙස

* අගමැති පත්කිරීම.
* ඇමතිවරු හා උප ඇමතිවරු පත්කිරීම.
* රාජ්‍ය සේවයේ සියළුම උසස් නිලධාරීන් පත්කිරීම.

- 1972 පළමු ජනරජ ස්වස්ථානික ව්‍යවස්ථාව යටතේ ද නිර්මාණය කරනු ලබන්නේ කැබිනට් ආණ්ඩුක්‍රම ආකෘතියට සමපාත වන ආණ්ඩුක්‍රමයක් බැවින් මෙම ආණ්ඩුක්‍රමය තුළද විධායකය ද්විත්ව ස්වරූපයකි. මෙම ආණ්ඩුක්‍රමය තුළ නාමික විධායකය වූයේ නාමික ජනාධිපතිවරයෙකි. මෙම ජනාධිපති බොහෝ කරුණු අතින් සොල්බරි ආණ්ඩුකරුට සමාන නොවීය. ජනාධිපති නිල කාලය වසර 4 කි. ජාතික රාජ්‍ය සභාවට මන්ත්‍රීවරුන් තෝරාපත් කොට ගැනීමේ මහ මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීමට ඡන්ද බලය හිමි කවරෙකු වුවද ජනාධිපති ලෙස පත් කිරීමට අගමැතිට බලය තිබුණි.
- 1947 සත්‍ය විධායකය ආශ්‍රිතව හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි.
- පාර්ලිමේන්තු මැතිවරණයකින් පසු ව්‍යවස්ථාදායකයට තේරී පත් වූ පක්ෂ හා කණ්ඩායම්වලින් ආණ්ඩුවක් පිහිටු වීමට තරම් බහුතර බලයක් හිමි කණ්ඩායම් නායකයාට නාමික විධායකය විසින් ආණ්ඩුවක් පිහිටු වීමට ආරාධනා කෙරෙන අතර එම පක්ෂ නායකයා අගමැති ලෙස නාමික විධායකය විසින් පත්කරයි.
- සොල්බරි සත්‍ය විධායකය නිල කාලය වසර 5 කි. එහෙත් එම වසර 5 ට පෙර ඔවුන් බලයෙන් පහකිරීමට සොල්බරි පාර්ලිමේන්තුවට හැකියාව තිබුණි.
- අගමැති හැර සෙසු කැබිනට් සාමාජිකයින් සියලුම දෙනාට අමාත්‍යාංශ විෂයක් පැවරීම සිදු කළේ අගමැති විසිනි.
- 1972 සත්‍ය විධායකයේ නායකයා වන අගමැති ජාතික රාජ්‍ය සභාවේ බහුතර බලය හිමි පුද්ගලයා වේ. සත්‍ය විධායකය බලයෙන් පහ කිරීමට ජාතික රාජ්‍ය සභාවට හැකියාව තිබුණි.

  * විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීමෙන්
  * ආණ්ඩුවේ මංගල ප්‍රතිපත්ති ප්‍රකාශය පරාජය කිරීම.
  * අයවැය ලේඛණය පරාජය කිරීම. (මෙම ක්‍රියාමාර්ග 1947 ටද අදාළ වේ)

- 1972 සත්‍ය විධායකය පිළිබඳව අවධානය යොමු කරන විට අගමැති හැරුණු කොට සෙසු කැබිනට් සාමාජිකයන් හා ජනාධිපති අතර සෘජු සබඳතාවයක් නොවීය.
- 1972 අගමැති පූර්ණ විධායකයක් වූ අතර ඔහුට සියලු බලතල නාමික විධායකය මගින් ක්‍රියාවට නැංවිය හැකිය.
- 1947 ස්ථාවර විධායකය කොටස් 2 කි. ඉහළ රාජ්‍ය සේවය හා පහළ රාජ්‍ය සේවය මෙහි ඉහළ රාජ්‍ය සේවකයන් අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකරු විසින් පත්කරන ලදී. අනෙකුත් සියළු සිවිල් සේවා නිලධාරීන් පත්කිරීම උසස් කිරීම හා ඔවුන්ගේ විනය පාලනය වැනි කාර්යන් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය සේවා කොමිසමට පවරමින් එම කොමිසමට ස්වාධීනව කටයුතු කළ හැකි ආකාරයේ පරිසරයක් ද නිර්මාණය කරන ලදී.
- රාජ්‍ය සේවයේ උසස් නිලධාරීන් ලෙස සැලකූ නීතිපති, විගණකාධිපති, මැතිවරණ කොමසාරිස්, පාර්ලිමේන්තු මහ ලේකම්, තානාපති ආදී ඉහළ සිවිල් සේවකයන් අගමැතිගේ උපදෙස් මත නාමික ජනාධිපති විසින් පත්කරන ලදී. මෙම ව්‍යවස්ථාව යටතේ ජනාධිපති සෘජුවම අගමැතිගේ කැමැත්ත මත තේරී පත්වන බැවින් 1947 සොල්බරි ව්‍යවස්ථාවට වෙනස්ව යමින් රාජ්‍ය සේවයේ ඉහළ නිලධාරීන් අගමැතිට අවශ්‍ය ලෙස නාමික විධායකය ලවා පත්කර ගැනීමේ හැකියාව තිබුණි.
- රාජ්‍ය සේවයයේ සෙසු නිලධාරීන් පිළිබඳව කටයුතු කිරීමේ බලය පවරා දී තිබුණේ අමාත්‍ය මණ්ඩලයටය. මෙහිදී දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම සෘජුවම අමාත්‍ය මණ්ඩල විසින් සිදු කෙරුණි.

(07) විධායක කාරක සභා

- එක් එක් කාරක සභාවට අවම වශයෙන් 6 ක් හෝ උපරිම වශයෙන් 9 ක් වන ආකාරයට සාමාජික සංඛ්‍යාව තීරණය විය.
- එක් එක් කාරක සභා වෙන වෙනම රැස්වී ඔවුන්ගේ බහුතර ඡන්දයෙන් සිය කාරක සභාවේ සභාපතිවරයා තෝරාපත් කොට ගත යුතුය.
- එලෙස තේරී පත් වූ සභාපතිවරයා නිල බලයෙන්ම අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු විය.

(08) (1) වැඩවසම් ක්‍රමයේ බිඳවැටීම සහ ධනවාදය ආරම්භ වීම / ක්‍රිස්තියානි ප්‍රතිසංස්කරණය / කාර්මික විප්ලවය සහ පුනර්ජීවන විප්ලවය / මුස්ලිම් ආක්‍රමණ

(2) භූමිය, ජල සංඛ්‍යාව, ආණ්ඩුව හා ස්වාධිපත්‍යය යන ලක්ෂණ වලින් සමන්විත වීම

එක් ජාතිකයක් සඳහා එක් රාජ්‍යයක් යන සංකල්පය ක්‍රියාත්මක වීම

වෘත්තීමය නිලබල ක්‍රියාත්මක වීම

මධ්‍යගත පාලන ක්‍රමය

අභ්‍යන්තර හා බාහිර ස්වාධිපත්‍යය